**නැගෙනහිර විශ්වවිද්‍යාලය - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) හා 108(1) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුයි.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදයට අනුව, වත්කම් භාවිතයට ගැනීමට සුදුසු තත්ත්වයට පත් කලවිට ක්ෂය වීම ආරම්භ ආරම්භ කළ යුතුය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව, වත්කම් අත්පත් කරගත් වර්ෂය තුළ ක්ෂය කිරීම සිදු කරනු නොලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා ක්ෂයවීම් රු.4,338,024 කින් අඩුවෙන් දක්වා තිබුණි. | - | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 50 වැනි ඡේදයට අනුව ආයතනයක මෙහෙයුම් වල එකම ස්වභාවයේ හෝ එකම භාවිතයෙන් යුතු වත්කම් වර්ග කර දැක්වීමකින් තොරව පිරිවැය රු.121,038,191ක්වූ අනෙකුත් වත්කම් සහ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන ව්‍යාපෘතිය කඩිනම් කිරීමේ ව්‍යාපෘතියෙන්(AHEAD) ලැබී තිබූ පිරිවැය රු.197,318,037ක්වූ වත්කම් දේපල,පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | 2023 මූල්‍ය ප්‍රකාශනයේ සිට අනෙකුත් වත්කම් සමාන ස්වභාවයක් ඇති වත්කම් කාණ්ඩ යටතේ වර්ග කිරීමට පියවර ගෙන ඇති අතර ක්ෂයවීම් අනුපාතය හෙළිදරව් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 වන ඡේදය සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 103 වන ඡේදය අනුව ජංගම නොවන වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව | යාවත්කාලීන කළ අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම සඳහා වත්කම් නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ | - එම- |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණු පිරිවැය රු.1,079,954,567 ක් වූ ස්ථාවර වත්කම් සහ පිරිවැය රු.6,247,846 ක් වූ අස්පෘශ්‍ය වත්කම් තව දුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කිරීමට නියමිත බව. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ දී ලැබී තිබුණු රු.288,849,301 ක්වූ ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව ආදායම ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉහත සඳහන් කළ මුදල ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 18 ට අනුව රු.4,646,464 ක් වටිනා පශු සම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වෙනම දැක්වීම වෙනුවට දේපළ, පිරියත සහ උපකරණ යටතේ වැරදි ලෙස අනාවරණය කර තිබුණි. | එය නිවැරදි කාණ්ඩය යටතේ පෙන්වනු ලබන බව. | - එම - |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සිට 2022 දක්වා වසර තුළ AHEAD ව්‍යාපෘතියෙන් ලැබුණු ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් ගණනය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ස්ථාවර වත්කම් සහ පොදු සංචිතය පිළිවෙලින් රු.78,206,842කින් සහ රු.39,880,387කින් වැඩියෙන් දක්වා තිබූ අතර වර්ෂය සඳහා ක්ෂයවීම් රු.38,326,454කින් අඩුවෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ ඌනතාවය රු.38,326,454 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 දී ජර්නලයක් මගින් ගැටළුව නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ගැටලුව නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ ස්ථාන 15ක පිහිටි හෙක්ටයාර 241.2ක භූමි ප්‍රමාණයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | හිමිකාරිත්වය පැවරීම අවසන් වූ පසු ක්‍රියාමාර්ග ගන්නා බව. | ඉඩම්වල වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | පිරිවැය රු.224,269,514 ක්වූ තෙමහල් ගොඩනැගිල්ලක් එහි ඉදිකිරීම් අවසන් කර 2020 අගෝස්තු මාසයේදී විශ්වවිද්‍යාලයට භාර දී තිබුණද, එදින සිට 2022 වසර දක්වා | භාරදීමේ ලේඛනවල 2020 වර්ෂය සඳහන් වුවද ප්‍රාග්ධනිතකරණය පිළිබඳ සැළකිලිමත් වූ අතර 2022 දී | වත්කම භාවිතයට ගැනීමට සූදානම් වූ |

| | | | |
|---|---|---|---|
| | ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව ගොඩනැගිලි වටිනාකම සහ පොදු සංචිතය පිළිවෙලින් රු.14,951,301කින් සහ රු.26,164,777 කින් වැඩියෙන් දක්වා තිබූ අතර වර්ෂයේ ක්ෂය රු.11,213,476 කින් අඩුවෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ ඌනතාවය රු.11,213,476 කින් අඩුවෙන් දක්වා තිබුණි. | සිදු කරන ලදී. | විට ක්ෂයවීම් ගණනය කළ යුතුය. |
| (ඈ) | ත්‍රිකුණාමල මණ්ඩපයට අදාළව AHEAD ව්‍යාපෘතියෙන් ලැබී තිබූ රු.22,025,643 ක් වටිනාකමැති වත්කම් සමාලෝචිත වර්ෂය තුළ දී දෙවරක් ප්‍රාග්ධනිත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, දේපල, පිරියත සහ උපකරණ මෙන්ම අනෙකුත් ප්‍රදානයන් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එය 2023 මූල්‍ය ප්‍රකාශන තුළ ජර්නල් වව්චරයක් මගින් නිවැරදි කර ඇති බව. | වත්කම් දෙවරක් ප්‍රාග්ධනිතවීම වැලැක්වීම සඳහා පාලන ක්‍රම ස්ථාපිත කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල හරහා සිදු කරන ලද රු.3,885,562ක විනෝදාස්වාද දීමනාව සඳහා ගෙවීම ආදායමක් ලෙස දැක්වීම වෙනුවට දෝෂ සහගත ලෙස විනෝදාස්වාද දීමනා වියදම් ගිණුමට බැර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ ආදායම සහ වියදම රු.3,885,562කින් අඩුවෙන් දක්වා තිබුණි. | විනෝදාස්වාද දීමනාව ස්වයං-උත්පාදන අරමුදලින් ගෙවා ඇති බව. | ආදායම් සහ වියදම් අවතක්සේරු නොවන පරිදි නිවැරදි ගිණුම්කරණ සටහන් ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) | එකතුව රු.1,112,648,116ක්වූ සීමිත අරමුදල (Restricte Fund), තෑගි, පරිත්‍යාග සහ අනෙකුත් ප්‍රදානයන් ස්කන්ධ ප්‍රාග්ධනය යටතේ දැක්වීමකින් තොරව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දෝෂ සහිත ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අදාළ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව මූල්‍ය ප්‍රකාශය සකස් කර ඇති බව. | මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ස්කන්ධ ප්‍රාග්ධනය සහ වගකීම් නිවැරදිව වර්ගීකරණය කිරීමට පියවර ගත යුතුය. |
| (උ) | AHEAD ව්‍යාපෘතියෙන් ලැබුණු වටිනාකම රු. 65,105,980ක්වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළදී ගිණුම්ගත කර නොතිබුණි. | 2022 අප්‍රේල් 30 දක්වා වත්කම් ප්‍රාග්ධනිත කර ඇති අතර ඉතිරි වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | බැංකු ගිණුමක එකතුව රු.3,925,059 ක්වූ සෘජු හර කිරීම් සහ බැංකු ගිණුම් 2 ක එකතුව රු.1,604,146 ක්වූ තැන්පතු වසර 12 කට වඩා වැඩි කාලයක සිට වියදම් සහ ආදායම් ලෙස හඳුනා නොගෙන බැංකු සැසඳුම් ප්‍රකාශය තුළ පිළිවෙලින් හඳුනා නොගත් හර සහ උපලබ්ධි | 2009 ට පෙර ලියකියවිලි සෙවීමේදී කවුන්සිලය අභියෝගවලට මුහුණ දුන් අතර එය කපා හැරීමට හේතු විය. ගැටලුව විසඳීමට කමිටු කිහිපයක් පත් කරන ලදී. | එම ශේෂයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| නොවූ තැන්පතු ලෙස දක්වා තිබුණි. | අනුමත කරන ලද නිර්දේශය අනුව බැංකු ගිණුම් තුන කපා හැරීම දක්වා තිබූ බව. |

**1.5.3 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව රු. | උපයෝගී ලේඛන අනුව රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| පාරිතෝෂක | 513,790,136 | 534,911,501 | 21,121,365 | එය 2023 මූල්‍ය ප්‍රකාශන තුළ ජර්නල් වවුචරයක් මගින් නිවැරදි කර ඇති බව. | පාරිතෝෂිත ප්‍රතිපාදන උපලේඛන සමග සැසදිය යුතුය |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට මුළු ලැබිය යුතු රු. 455,463,867 ක ශේෂයෙන් රු.238,964,922 ක් හෝ සියයට 52 ට සමාන මුදලක් වසර 03 සිට වසර 40 දක්වා කාලයක් තුළ අයකරගෙන නොතිබුණි.<br><br>එයින් වසර 10 සිට වසර 40 දක්වා කාලයක් ගත වී තිබූ බැඳුම්කර ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් 70 දෙනෙකුගෙන් රු.150,320,855 ක බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | පාලක සභාව විසින් 2005 ට පෙර ලේඛන සොයා ගැනීමේ හැකියාවක් නොමැති බව ප්‍රකාශ කර ඇති අතර 2009 ට පෙර හඳුනාගත නොහැකි ශේෂ කපා හැරීමට කටයුතු කරන බව. අදාල රෙගුලාසි සහ කෝප් කමිටු මාර්ගෝපදේශයන්ට අනුකූලව ගැටළුව නිවැරදි කිරීමට විශ්වවිද්‍යාලය සක්‍රීයව කටයුතු කරන බව. 2010 ට පෙර පැරණි අත්තිකාරම් සඳහා අවශ්‍ය ලියකියවිලි ලබා ගත් පසු වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලබන බව.<br><br>බැඳුම්කර අයකර ගැනීම් සහ සමාලෝචන කමිටුව විසින් බැඳුම්කර පැහැර හරින අයගේ පවතින UPF ශේෂවලින් බැඳුම්කර වටිනාකම් අයකර ගැනීම සඳහා ඔවුන්ගේ කැමැත්ත ලබා ගැනීමට උපදෙස් දෙන ලද බව. | ලැබිය යුතු මුදල් සහ බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,973,526ක් වූ ගෙවිය යුතු හිඟ ජීවන වියදම් දීමනා, ණය සහ අත්තිකාරම් වැඩියෙන් අය කිරීම,<br><br>විවිධ ණය හිමියන් සහ ගෙවිය යුතු විගණන ගාස්තු වසර 03 සිට වසර 18 දක්වා කාලයක් තුළ නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් | ගෙවිය යුතු සියලුම හිඟ මුදල් නියමිත වේලාවට පියවීමට මේ වන විට උත්සාහ ගනිමින් සිටින බව. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් ගෙවිය යුතු යටතේ දක්වා තිබුණි.

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ මූල්‍ය රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වසර 03 සිට 07 දක්වා කාලයක් තුළ ගිණුම්වල දක්වා තිබූ රු.15,940,456 ක් වූ රඳවා ගැනීමේ මුදල් සහ රු.6,916,081ක්වූ ආපසු ගෙවිය යුතු තැන්පතු නිරවුල් කිරීමට හෝ රජයේ ආදායම බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | දෝෂ සහිත වගකීම් කාලයෙන් පසුව රඳවා ගැනීමේ මුදල් ගෙවන බව. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | | | |
| | (i) IV පරිච්ඡේදයේ 1.1 වගන්තිය | ත්‍රිකුණාමල මණ්ඩපයේ පරිගණක විද්‍යා අංශයේ කථිකාචාර්යවරයෙකු ලෙස මුලින් පත්වීම් ලැබූ පළමු ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු අදාළ රෙගුලාසිවලට පටහැනිව, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ බහුවිධ අධ්‍යයන අංශයට මාරුකර යවා තිබුණි. කෙසේ වෙතත්, කථිකාචාර්යවරයා 2020 නොවැම්බර් 19 සිට 2022 සැප්තැම්බර් 01 දක්වා කාලය තුළ අපේක්ෂිත වැඩ සම්මතයෙන් තාක්ෂණ පීඨයේ දේශන පැය 45 ක් හෝ සියයට 7 ක් පමණක් පවත්වා තිබුණි. | පාලක සභාව විසින් ඔහුව ස්ථාන මාරු කර ඇත්තේ දුක්ගැනවිලි කමිටු නිර්දේශ මත සහ ගැටලු සාමකාමීව විසඳා ගැනීමට බව. | ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| | (ii) III පරිච්ඡේදයේ 20.8 උප වගන්තිය සහ VI පරිච්ඡේදයේ 4.1 උප වගන්තිය | 2018 පෙබරවාරි 24 දින ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකුගේ සහ 2020 අගෝස්තු 29 දින උද්භිදවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගේ ඉල්ලා අස්වීම පාලක සභාව විසින් පිළිගෙන තිබුණි. පසුව ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති සහ කථිකාචාර්යවරයා පිළිවෙලින් 2018 | පාලක සභාව විසින් නැවත සේවයේ නියුක්ත කිරීම පිළිබඳව තීරණය කිරීමේ බලය සහ ඇය ඉල්ලා අස්වීමට පෙර තීරණය කළ උද්භිද විද්‍යා අංශයේ පළමු පන්තියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට හිමි වැටුප් තලය ගෙවීමට උපකුලපතිට පවරන ලද බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | මැයි 17 සහ 2020 සැප්තැම්බර් 02 සිට බලපාන පරිදි කලින් දරන ලද තනතුරෙහි නැවත සේවයේ පිහිටුවා තිබුණි. කෙසේ වෙතත්, අදාළ රෙගුලාසිවලට පටහැනිව වැටුප් පියවරයන්හි පිහිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නැවත සේවයේ නියුක්ත වූ දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා නිලධාරීන් දෙදෙනාටම රු.4,965,152 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. | | |
| (iii) | III පරිච්ඡේදයේ 26.7.2 උපවගන්තිය | පුවත්පත් මගින් ප්‍රචාරණය කිරීමකින් තොරව බාහිර කථිකාචාර්යවරුන් බඳවාගෙන තිබුණි. | ඉදිරියේදී මෙම කාර්යය විධිමත් කිරීමට පියවර ගනු ලබන බව | - එම - |
| (iv) | XX වෙනි පරිච්ඡේදයේ 3.1 උපවගන්තිය හා 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා 2022 වර්ෂය තුළදී එකතුව රු.978,942,951 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | සම්ප්‍රදායට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීම සටහන් නොකරන බව. | ආයතන සංග්‍රහයේ සහ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (v) | 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපිය මගින් සංශෝධිත XXVI පරිච්ඡේදයේ 3 වගන්තිය. | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පවත්වා එහි වාර්තාව 2023 මාර්තු 17 හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ලබා දිය යුතු වුවද, එම වාර්තාව 2023 ජූලි 07 වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2020 සහ 2021 වසර සඳහා සමීක්ෂණ වාර්තාවේ නිර්දේශය මත සහ එහි භාවිතයට නුසුදුසු භාණ්ඩ බැහැර කිරීම අවසන් කර නොතිබුණි.<br><br>තවද, 2020 වර්ෂය සඳහා වන සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව, විශ්වවිද්‍යාලයේ අංශ 18ක භාණ්ඩ අයිතම 579ක් අස්ථානගත වී ඇති බවට වාර්තා කර තිබුණි. කෙසේ | භාණ්ඩ සමීක්ෂණ වාර්තා කාලෝචිතව ඉදිරිපත් කිරීම සඳහා කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇති බව. භාවිත කළ නොහැකි භාණ්ඩ බැහැර කිරීම සඳහා 2019 වර්ෂය සඳහා වෙන්දේසිය 2023 අප්‍රේල් මාසයේදී පවත්වන ලද අතර 2020 සහ 2021 වෙන්දේසි සඳහා සූදානම් කරන බව.<br>වගවීම තීරණය කිරීම සඳහා විමර්ශනය සිදුවෙමින් පවතින අතර සුදුසු ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලබන බව. | - එම -<br><br>මුදල් රෙගුලාසිවලට අනුව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙතත්, මුදල් රෙගුලාසි 103(1) අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | | | |
| (i) 2018 ඔක්තෝම්බර් 12 දිනැති ලිපිය | මහපොළ භාරකාර අරමුදල් මාසිකව ප්‍රතිපූරණය කළ යුතු වුව ද රු.2,305,000 ක් වසර තුනකට වැඩි කාලයක සිට ප්‍රතිපූරණය නොකර අයවිය යුතු ලෙස දක්වා තිබුණි. | ශිෂ්‍යාධාර අරමුදල් ප්‍රතිපූරණය කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ නිරන්තර සන්නිවේදනය සහ පසු විපරම් පවත්වාගෙන ගිය බව. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛය. | 2022 වසරේ කලා හා සංස්කෘතික පීඨයේ පවත්වන ලද විභාගවල විෂයයන් 215 න් විෂයයන් 31 ක ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 01 සිට 05 දක්වා ප්‍රමාද වී තිබුණි. එසේම, 2022 වසරේ විද්‍යා පීඨයේ පවත්වන ලද විභාගවල විෂයන් 42 න් විෂයයන් 24 ක ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 1 සිට 7 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | ආයතන චක්‍රලේඛ අංක 15/2015 අනුව විභාග ප්‍රතිඵල නියමිත වේලාවට නිකුත් කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (iii) 2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4 වැනි ඡේදය. | 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.130,298,076 ක් වූ පුස්තකාල පොත් සහ වාර සඟරාවල පිරිවැය සත්‍යාපනය කර නොතිබුණි. | පුස්තකාලය එහි සියලුම පොත්වල ඩිජිටල් ඉන්වෙන්ටරි සම්පූර්ණ කර ඇති අතර සමීක්ෂණ මණ්ඩලයේ කටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතින බව. | - එම - |
| (iv) 2022 පෙබරවාරි 23 දිනැති අංක 03/2022 සහ මුදල් චක්‍රලේඛ ලිපිය. | 2022 වර්ෂය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්ට මාසික ඉන්ධන සීමාව ලීටර් 145කට සීමා කර ඇත. කෙසේ වෙතත්, 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ අනුමත සීමාව ඉක්මවා රු.1,012,079ක් වටිනා ඉන්ධන ලීටර් 2,983ක් ලබා දී තිබුණි. | පාලක සභාවේ නිර්දේශය සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට දැනටමත් කටයුතු කර ඇති බව. | - එම - |
| (ඇ) 2015 ඔක්තෝම්බර් 03 වැනි දින පැවති 257 රැස්වීමට අනුව විශ්වවිද්‍යාලයේ නිසි බලධාරී වෙත නිකුත් කරන ලද 2015 | වෛද්‍ය නිලධාරියා විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම සටහන් කිරීම සඳහා වූ උපදෙස් 2023 පෙබරවාරි 27 වන දින දක්වාම පිළිපැද නැති අතර, 2015 ඔක්තෝබර් සිට 2023 පෙබරවාරි දක්වා වැටුප් හා | දෛනික පැමිණීම සඳහා වාර්තා පොතක් පවත්වා ගෙන ගොස් ඇති බවත්, එය වරින් වර රෙජිස්ට්‍රාර්වරයා විසින් නිරීක්ෂණය කර ඇති බව. | ආයතන සංග්‍රහයේ සහ පාලක සභා තීරණයට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

| | |
|---|---|
| ඔක්තෝබර් 12 දිනැති අංක EUSL/EST/ 06/2015 දරන ලිපිය. | දීමනා ලෙස එකතුව රු.9,277,829ක් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.503,716,980ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.244,038,580ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.259,678,400ක පිරිහිමක් නිරීක්ෂණය විය. මෙම පිරිහිමට ක්ෂයවීම් සහ ක්‍රමක්ෂකරණ වියදම්, ශිෂ්‍යසුම්ගත සේවා, අනෙකුත් මෙහෙයුම් වියදම්, සහ සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය පිළිවෙලින් රු. 90,222,753කින්, රු.70,678,489කින්, රු.56,721,660කින්, සහ රු.53,213,132 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පුද්ගලික වැටුප් වැනි වියදම් රු.144,475,594 කින් එනම් පෙර වසරට සාපේක්ෂව සියයට 9 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය සැකසීම සඳහා 2013 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ දී පුද්ගලික සමාගමකට රු. 6,247,846 ක මුදලක් ගෙවා තිබුණද, ලේඛනය ක්‍රමානුකූලව යාවත්කාලීන කර නොතිබූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විටත් සමහර ගනුදෙනු ඇතුළත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛනය සකස් කිරීමට දරන ලද වියදම නිෂ්ඵල වී තිබුණි. | ස්ථාවර වත්කම් පද්ධතිය සියයට අනුවක් පමණ යාවත්කාලීනව සම්පූර්ණ කර ඇති අතර එහි ප්‍රගතිය කඩිනම් කිරීමට කටයුතු කරනු ලබන බව. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට සහ එහි ඇති ගැටළු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | එක්සත් රාජධානියේ ආචාර්ය උපාධියක් සඳහා රු.14,258,446 ක බැඳුම්කරයක් අත්සන් කළ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ කථිකාචාර්යවරයකුට අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යයන නිවාඩුවේ ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස විශ්වවිද්‍යාලය ඉල්ලීමක් කර තිබූ අතර, ඒ හේතුවෙන් විශ්වවිද්‍යාලයට රු.3,601,837 ක අමතර මුදලක් වැය වී ඇති බැවින් ඊට වගකිව | මුලදී මාස 45 ක අධ්‍යයන නිවාඩු ලබා දුන් අතර අධීක්ෂණයෙන් පසුව මාස 39 දක්වා අඩු කරන ලදී. පසුව, ඇය මාස 45 ක් සඳහා අභියාචනයක් ඉදිරිපත් කළ අතර එය අවසානයේ දී පාලක සභාව විසින් අනුමත කරන ලද බව. | වගකිවයුතු නිලධාරියාට එරෙහිව පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යුතු නිලධාරියාට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඇ) | විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව 2014 වසරේ සිට රජයේ බැංකු ශාඛා දෙකක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) දෙකක් සඳහා විශ්වවිද්‍යාලය පහසුකම් සපයා තිබුණි. තවද, මෙම ආයතනවලින් මේ දක්වාම පවා කුලී අයකර ගැනීමද සිදුකර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කුලී මුදලේ ප්‍රමාණය ලබාගෙන තීරණය කිරීමටත් බැංකු සමඟ විධිමත් ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම අත්සන් කිරීමටත් කුලී අයකර ගැනීමටත් අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයකු 2018 මාර්තු 02 දින ඉල්ලා අස්වී ශ්‍රී ලංකා මහ බැංකුවට සම්බන්ධවී තිබුණි.පාලක සභාව විසින් ඉල්ලා අස්වීම පිළිගත් නමුත් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් දැනුම් දීමට නොහැකි වී තිබුණි. 2018 මැයි 17 දින නැවත විශ්වවිද්‍යාලයේ රාජකාරි ආරම්භ කර තිබූ අතර පාලක සභාව විසින් අඛණ්ඩව සේවා කාලය සැලකීම සඳහා සේවයේ නොසිටි කාලපරිච්ඡේදය වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු ලෙස සලකා තිබුණි. කෙසේ වෙතත්, ඔහු 2018 මාර්තු 02 සිට මැයි 16 දක්වා අවසරයකින් තොරව ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන පුස්තකාලයාධිපති තනතුර භාර ගැනීමෙන් පත්වීම් ලිපියේ 14 වගන්තිය උල්ලංඝනය කර තිබුණි. තවද, III පරිච්ඡේදය 20.8 සහ VI පරිච්ඡේදයේ 4.1 ඡේදය උල්ලංඝනය කරමින් රු.62,695 වැටුප් පියවර වෙනුවට රු.67,807ක වැටුප් පියවරයෙහි තැබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දක්වා රු.2,553,876ක් වැඩියෙන් ගෙවා තිබුණි. | කිසිදු පූර්ව සේවාවක් හෝ නිලයක් පවත්වා නොමැති ලෙස සලකා පාලක සභාව විසින් ඔහුගේ ඉල්ලා අස්කර ගැනීමේ ඉල්ලීම අනුමත කරන ලදී. 2018 මැයි 17 වන දින එම වැටුප් පියවරයේම නැවත සේවයේ නියුක්තවීමට තුඩු දෙන කාල සීමාව වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු බවට පරිවර්තනය කරන ලද බව. | උල්ලංඝනය කරන ලද පත්වීම් ලිපිය නිවැරදි කිරීමට හෝ නිවැරදි පටිපාටියට අනුව නැවත සේවයේ පිහිටුවීමට පියවර ගත යුතුය. |
| (ඉ) | අලුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ලක නැවත ස්ථාපනය කරන ලදී. කෙසේ වෙතත්, 2013 දී රු.67,853,580 කට ප්‍රාග්ධනිත කරන ලද කලින් පදිංචිව සිටි ගොඩනැගිල්ල කුලියට දීමකින් තොරව හිස්ව පැවතීම නිසා අමතර ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | ප්‍රගතිය සිදු කරමින් පවතින බව. | අමතර ආදායමක් උපයා ගැනීම සඳහා ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ පවතින විෂයයන් සහ විෂය නිර්දේශයන් රැකියා වෙළෙඳපොළට සහ රටේ ජාතික ආර්ථිකයට ගැළපෙන පරිදි යාවත්කාලීන කළ යුතු අතර, දිනෙන් දින වෙනස් වන රැකියා වෙළෙඳපොළට අනුගත වන පරිදි තාක්ෂණික විෂයයන් සහ භාෂා කුසලතා විෂය මාලාවට ඇතුළත්කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යවහාරික විද්‍යා පීඨවල විෂය නිර්දේශය, එම පීඨය ආරම්භයේ සිටම සංශෝධනය කර නොතිබුණි. | පරිගණක විද්‍යාව පිළිබඳ BSc විෂය මාලාව සංශෝධනය කර ඇති අතර අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින බව. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නිරන්තරයෙන් වෙනස් වන රැකියා වෙළඳපොළට අනුගත වන පරිදි විෂයමාලා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශිෂ්‍යයාගේ ප්‍රොස්පෙක්ටස් වලට අනුව, ත්‍රිකුණාමල මණ්ඩපයේ සිද්ධ වෛද්‍ය උපාධිය (BSMS) අධ්‍යයන වර්ෂ 05ක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය. කෙසේ වෙතත්, 2014/2015 අධ්‍යයන වර්ෂයේ BSMS වැඩසටහන සඳහා 2016 වර්ෂයේදී ලියාපදිංචි වූ සිසුන් 46 දෙනෙකු එම වැඩසටහන සම්පූර්ණ කිරීමට වසර 07ක් ගතකර තිබුණි. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම ප්‍රමාද වීම සිසුන්ගේ වෘත්තීය සහ රැකියා අවස්ථා කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය. මීට අමතරව, 2012/2013 සහ 2013/2014 අධ්‍යයන වර්ෂ සඳහා පිළිවෙළින් 2014 සහ 2015 දී ලියාපදිංචි වූ සිසුන් ද අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට වසර 7 කට වඩා කාලයක් ඉක්මවා තිබුණි. | පාස්කු ප්‍රහාරය, කොවිඩ්-19 සහ ආර්ථික අර්බුදය වැනි ගැටලු සහ බාහිර සාධක හේතුවෙන් මණ්ඩපය වසා දැමීමට සිදු වී තිබුණි. කාර්ය මණ්ඩල හිඟය ද මෙම ප්‍රමාදයට හේතුවී තිබුණි. 2013/2014 කණ්ඩායමේ සිසුන් අධ්‍යාපනය හැර යාම සහ අවසන් විභාග සඳහා සුදුසුකම් නොලැබීම හේතුවෙන් සිසුන් 40 දෙනෙකු පමණක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි.. | කාලානුරූපීව උපාධි පාඨමාලාව අවසන් කිරීමටත් වෘත්තීය අපේක්ෂාවන් වැඩිදියුණු කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේදී මහාචාර්යවරයකු සඳහා පර්යේෂණ ප්‍රදාන වශයෙන් රු.7,500,000 අනුමත කර තිබූ අතර 2020 මැයි මාසයේදී පර්යේෂණය අවසන් කිරීම සඳහා අවසාන වශයෙන් කාලය දීර්ඝ කරදී තිබුණි. කෙසේ වෙතත්, එම ප්‍රතිපාදනවලින් රු.4,500,000ක් වැය කර තිබුණද 2023 මැයි 04 වනදා දක්වාම පර්යේෂණය අවසන් කර නොතිබුණි. | පර්යේෂකයා අවසාන පර්යේෂණය ඉදිරිපත් කළ අතර සමාලෝචකයන්ගේ අදහස් ඇතුළත් කිරීමට බලා සිටින බව. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව පර්යේෂණ අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්ක්‍රීය හෝ අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) එකතුව රු.3,495,497ක් වූ අරමුදල් වසර 2 සිට වසර 5 දක්වා කාලපරිච්ඡේදයක් තුළදී අපේක්ෂිත අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | ඉතිරිය නියම කර ඇති අරමුණු සඳහා විචක්ෂණශීලීව භාවිතා කරනු ලබන බව. | එම අරමුදල අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කළ යුතුය. |
| (ආ)සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගෘහ භාණ්ඩ, වෛද්‍ය තාක්ෂණික උපකරණ සහ අන්තර්ජාල සේවා සැපයීම සඳහා කුවේට් අරමුදලින් රු.263,374,811 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් වායු සමීකරණය, රසායනාගාර ගෘහභාණ්ඩ සහ අල්මාරි, යටිතල පහසුකම් සහ අරමුදල් සීමා කිරීම් හේතුවෙන් වටිනාකම රු.147,574,057ක් වූ අයිතම 70කට අදාළ වෛද්‍ය උපකරණ හා මණ්ඩල කාමර පද්ධතිය (boardroom system) වසර 01 සිට වසර 02 දක්වාවූ කාලපරිච්ඡේදයක් භාවිතයට ගෙන නොතිබුණි . | රජයේ ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන් කුවේට් අරමුදල තාවකාලිකව සීමා කර තිබූ බැවින් සියලුම උපකරණ සහ ගෘහ භාණ්ඩ ප්‍රසම්පාදනය අත්හිටුවා තිබුණි. කුවේට් අරමුදල නිදහස් කළ පසු අවශ්‍ය පහසුකම් ලබා දෙනු ලබන බව. | නිසි උපකරණ භාවිතය සහතික කිරීම සහ සිසුන්ගේ ප්‍රායෝගික සැසි වැඩිදියුණු කිරීම සඳහා අත්‍යාවශ්‍ය වෛද්‍ය විද්‍යාගාර පහසුකම් සඳහා අරමුදල් සුරක්ෂිත කිරීමට හෝ විකල්ප මූලාශ්‍ර ගවේෂණය කිරීමට ප්‍රමුඛත්වය දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2020 වසරේ සිට 2022 වසර දක්වා කාලය තුළ දී AHEAD ව්‍යාපෘතිය මගින් පීඨ 5ක් සඳහා ලබා දී තිබූ රු.41,121,595 වටිනාකමැති ගෘහභාණ්ඩ සහ උපකරණ මාස 5 සිට අවුරුදු 3 දක්වා කාලපරිච්ඡේදයක් තුළදී අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිත කර නොතිබුණි. | පූර්ව වත්කම් සත්‍යාපන විගණනය විශ්වවිද්‍යාලය විසින් සිදු කර ඇත. ඒ අනුව මෙම ගැටලුව නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගෘහ භාණ්ඩ හා උපකරණ අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) අධ්‍යයන කටයුතු අංශයට අයත් විභාග කටයුතු සඳහා භාවිත කරන නැමීමේ මේස එක් දහස් දෙසිය එකක් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් සත්‍යාපනය කර නොතිබුණි. එසේම නැමීමේ මේස 124ක් භාවිතයට නොගෙන පැරණි කෘෂිකර්ම පීඨ පරිශ්‍රයේ ගබඩා කර තිබූ බව විගණන පරීක්ෂණයේදී අනාවරණය විය. | ගැටලුව නිවැරදි කිරීමට වහාම පියවර ගනු ලබන බව. | ගැටලුව නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) පිරිවැය රු.6,006,875 ක් වූ මෝටර් රථ දෙකක්, වෑන් රථයක් සහ ලොරියක් ඇතුළු වාහන 4 ක් 2021 ජුනි මාසයේ සිට මේ දක්වා අපේක්ෂිත කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබූ බව වත්කම් පිළිබඳ භෞතික සත්‍යාපනයේ දී අනාවරණය වී තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් නිසි පියවර ගෙන නොතිබුණි. | නිරන්තර බිඳවැටීම් සහ අධික ඉන්ධන පරිභෝජනය සහිත වයස්ගත වාහන සඳහා මිල අධික නඩත්තුවක් අවශ්‍ය වේ. සීමිත භාවිතය අත්‍යවශ්‍ය අවස්ථාවන් සඳහා පමණි. විශ්වසනීය ප්‍රවාහන විකල්ප සඳහා ඉඩකඩ සලසමින් කාර්යක්ෂම බැහැර කිරීම සඳහා ඒවා වෙන්දේසි කිරීමට සැලසුම් කරමින් පවතී. | කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ නඩත්තු වියදම් අවම කිරීම සඳහා වාහන ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසියක් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

**3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් සහ ප්‍රමාණවත් අරමුදල් නොමැතිව, ත්‍රිකුණාමල පරිශ්‍රයේ අභ්‍යන්තර මාර්ගයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 මැයි 02 දින මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රදානය කර තිබුණි. මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් 145,000,000ක් වූ අතර ඉන් පළමු අදියර සඳහා කොන්ත්‍රාත් වටිනාකම රු.55,775,000 ක් විය. ගිවිසුමට අනුව, කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 01 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, පළමු අදියර සඳහා වූ කොන්ත්‍රාත්තුවේ සියයට 45 ක පමණ භෞතික ප්‍රගතියක් පැවතියදී 2017 නොවැම්බර් මාසයේදී කොන්ත්‍රාත්තුව අත්හැර දමන ලදී. පසුව, 2019 දෙසැම්බර් 03 දින කොන්ත්‍රාත්තුව නැවත ආරම්භ කරන ලද නමුත් 2023 මැයි 23 වන විට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 36ක් පමණක් විය. | අරමුදල් වෙන්කිරීමේ උපකල්පනවලින් ගෙවීම් ප්‍රමාදයන් නතර විය. 2019 දී නැගෙනහිර විශ්වවිද්‍යාලය සහ RDA ගිවිසුම විසඳීම අරමුණු කර තිබුණි. පාස්කු ප්‍රහාරය, COVID-19, ආර්ථික අර්බුදය ප්‍රගතිය අවාසිදායක විය. අභියෝග මධ්‍යයේ වුවද, I අදියර 2022 අග වන විට 95% සම්පූර්ණ කිරීමට හැකි වූ බව. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් වටිනාකම රු.674,470,220 කට ත්‍රිකුණාමලය මණ්ඩපයේ බහුකාර්ය ශ්‍රවණාගාරයක් සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 09 දින ප්‍රදානය කර තිබුණි. ගිවිසුමට අනුව, කොන්ත්‍රාත්තුව පෙබරවාරි 08 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. 2021 කෙසේ වෙතත්, 2023 මැයි 23 වන විට භෞතික ප්‍රගතිය සියයට 09ක් පමණක් පැවතුණි. | ප්‍රතිපාදන හිඟය හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘතිය ප්‍රමාද වී ඇත - එනම් රු. මිලියන 155 ක අත්තිකාරම් මුදලින් රු. මිලියන 25 ක් පමණක් ලබා දී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ප්‍රගතිය කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ යෝජනාවට හේතු වූ බව. කොන්ත්‍රාත්කරු දිගටම කරගෙන යාමට කැමැත්ත පළ කළ නමුත් COVID-19 සහ ආර්ථික අර්බුදය හේතුවෙන් 2021 මැද භාගය දක්වාම බලපෑ ව්‍යාපෘතියේ ප්‍රගතිය තවදුරටත් ප්‍රමාදයන්ට මුහුණ දුන් බව. | - එම - |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2012 සංශෝධිත කාර්යය මණ්ඩලය අනුව 2013 ජනවාරි 31 වන දින හෙද | 2016 ජනවාරි සහ 2021 පෙබරවාරි වලදී පුරප්පාඩු සඳහා බඳවාගැනීමට | පුරප්පාඩුව පිරවීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | නිලධාරී II ශ්‍රේණිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිළධාරියෙකු අනුමත කරනු ලැබුවද, මේ දක්වා ස්ථිර හෙද නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණි. එසේ වුවද වසර 10කට වඩා වැඩි කාලයක සිට කොන්ත්‍රාත් පදනම මත හෙද නිලධාරියකු බඳවාගෙන තිබුණි. | අයදුම්පත් කැඳවනු ලැබුවද සුදුසුකම් ලත් අයදුම්කරුවන් ඉදිරිපත් නොවුණි. එසේ වුවද වෛද්‍ය මධ්‍යස්ථානයට පවතින ඉල්ලුම හේතුවෙන් කොන්ත්‍රාත් පදනම මත සිටින හෙද නිලධාරියාගේ නිල කාලය දීර්ඝ කරන ලද බව. | කළ යුතුය. |
| **(ආ)** | සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ මහාචාර්ය, කථිකාචාර්ය, තාවකාලික කථිකාචාර්ය, තාවකාලික හෙද නිලධාරි, සහ තාවකාලික පර්යේෂණ සහකාර වැනි තනතුරු පනස් පහක් මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් පුරප්පාඩු වී පැවතුණි. | බොහෝ දැන්වීම් පල කලද මහාචාර්ය පුරප්පාඩු සඳහා අවම උනන්දුවක් දක්නට ලැබුණු අතර, සමහර ක්ෂේත්‍ර සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් නොකෙරුණි. පසුගිය වසර 5 තුළ පත්වීම් කිහිපයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ රඳවා ගැනීම සිදුකළ බව. | - එම - |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට අනුව, අංශ, මධ්‍යස්ථාන, ඒකක සහ සෙල ඇතුළුව පීඨ 6ක් සහ අනෙකුත් අංශ 10ක් හරහා ක්‍රියාත්මක කිරීමට මුළු ක්‍රියාකාරකම් 1,262ක් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම සැලසුම්ගත ක්‍රියාකාරකම් අතරින් ක්‍රියාකාරකම් 638ක් ආරම්භ කර නොතිබූ අතර, එය සැලසුම් කර ඇති සමස්ත ක්‍රියාකාරකම්වලින් සියයට 51ක් විය. | 2022 ප්‍රගති වාර්තා අනුව ආර්ථික අර්බුදය හේතුවෙන් අදාළ අරමුදල් හිඟය සහ ශිෂ්‍ය නොපැමිණීම ක්‍රියාකාරකම් ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් හේතු වූ බව. | ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |